# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| දිනය | : | 2023.04.25 |
| වේලාව | : | පෙ.ව. 09.00 |
| ස්ථානය | : | ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව |
| **මූලාසනය** | **:** | **ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)** |

## සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

| | | | |
|---|---|---|---|
| 01) | පී.සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් (බ.ප.) |
| 02) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප) |
| 03) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප) |
| 04) | සිරිසෝම ලොකුවිතාන මයා | - | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප.) |
| 05) | චන්දන රණවීර ආරච්චි මයා | - | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප.) |
| 06) | ගාමිණී ධර්මසේන මහතා | - | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප) |
| 07) | ඩබ්ලිව්.එම්.දයාවතී මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 08) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 09) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 10) | කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 11) | කේ.ආර්.අබේසිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 12) | කේ.ජී.එස්.ප්‍රසන්න මයා | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 13) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරී,ප්‍රධාන ලේකම් කාර්යාලය |
| 14) | එස්.ඩී.ඒ.කීර්තිරත්න මිය | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.) |
| 15) | පේෂලා ආර්. අබේසූරිය මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| 16) | කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| 17) | ආර්.එම්.ඩී.ඩී. කුමාරි මිය | - | ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ (වැ.බ.), මාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශය (බ.ප.) |

**ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.**

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | කාර්ය සාධන තරඟාවලිය සම්බන්ධව | කාර්ය සාධන තරඟාවලිය සඳහා මේ වන විට ඇතුලත්ව නොමැති ආයතන වල නාම ලේඛනය ඉදිරිපත් කරන ලදී. ඒ අනුව කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් ආයතන 118 න් 11 ක්, සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතන 141 ක්, අධ්‍යාපන අමාත්‍යාංශයට 1349 න් 867 ක් ලෙස ආයතන 1019ක් මෙම තරඟාවලිය සඳහා ඇතුලත්ව නොමැත.<br>මේ අනුව එම ආයතනවලට අයත් අමාත්‍යාංශ ප්‍රධානීන් විසින් මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කර එය තරඟාවලියක් ලෙස නොව කාර්ය සාධන ඇගයීමේ වැඩසටහනක් ලෙස හඳුන්වා සියලුම ආයතන මේ හා සම්බන්ධ කරවීමට ක්‍රියාකරන ලෙස දන්වන ලදී.<br>ඒ අනුව මේ සඳහා ඇතුලත්වීමට සියලුම ආයතනවලට තවත් සති දෙකක කාලයක් ලබා දීමට තීරණය කළ අතර තවදුරටත් ඇතුලත් නොවන ආයතන සම්බන්ධව තොරතුරු ඇතුලත් වාර්තාවක් ගරු ආණ්ඩුකාරතුමාට ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>තවද, එම වැඩසටහනට අයත් අනෙකුත් සියලුම කටයුතු කාල රාමුවට අනුකූලව සිදු කිරීමට කටයුතු කරන ලෙසද වැඩිදුරටත් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 02. | බස්නාහිර පළාත් අමාත්‍යාංශවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධව | පවතින පුරප්පාඩු සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය නිකුත් කිරීමෙන් පසු බහුකාර්ය සංවර්ධන බලකායේ සහායකයින් ලබා දීමට කටයුතු කල හැකි බවත් දැනට ලබාදී ඇති සංඛ්‍යාවෙන් පුරප්පාඩු සඳහා යෙදවීමේදී සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රවල සුළු සේවක පුරප්පාඩු සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 03. | ප්‍රතිපාදන මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | පළාත් සංවර්ධන ප්‍රදාන මගින් ලැබෙන ප්‍රතිපාදනවලින් අමාත්‍යාංශ මට්ටමින් 90% කට වැඩි ප්‍රතිශතයක් ලබා දෙන ලෙස දන්වන ලදී. තවද, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) සඳහා ලබා දී ඇති ප්‍රතිපාදනවලින් 50% ක ප්‍රමාණයක් සඳහා ප්‍රමුඛතා ගත කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව මුලා අංශය හරහා අනුමැතිය සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යවා ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් දන්වා සිටින ලදී.<br>නඩත්තු සඳහා වන වැයවලින් අත්‍යවශ්‍යම අලුත්වැඩියාවන් පමණක් සිදු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| | | තවද, කොන්ත්‍රාත්කරුවන් සපයා ගැනීම සඳහා පුවත්පත් 05 ක දැන්වීම් පළ කර ඇති අතර 2023.05.03 දිනට එය ලබා ගෙන අවසන් කිරීමට බලාපොරොත්තු වන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් ප්‍රකාශ කරන ලදී.<br>එමෙන්ම මේ වන විට ඉදිකිරීම් භාණ්ඩවල මිලගණන් වෙනස් වී ඇති බැවින් මිල කමිටු පවත්වා මිල ගණන් සංශෝධනය කිරීමට කටයුතු කරන ලෙස ගරු ආණ්ඩුකාරතුමා උපදෙස් ලබා දී ඇති බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ ලදී. | |
| 04. | විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීම. | විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමේදී එම සියලුම පිළිතුරු මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක් කිරීමෙන් පසුව ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු/ සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 05. | ඉංජිනේරු අංශයේ පුරප්පාඩු සඳහා නිලධාරීන් ලබා ගැනීම. | ඉංජිනේරු කටයුතු පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයේ (CECB) සිටින ඉංජිනේරුවරුන් හා කාර්මික නිලධාරීන් රජයේ ආයතන වල පවතින පුරප්පාඩු සඳහා සේවයේ යොදවා ගත හැකි බවට මධ්‍යම රජය මඟින් අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන ඇති අතර, අප ආයතනය මඟින් ගෙවන වැටුප ඔවුන්ට ගෙවීමෙන් ඔවුන්ගේ සේවය පළාත් සභාවට ලබා ගත හැකි බවත් ඉතිරි කොටස එම ආයතනය මඟින් ඔවුන්ට ගෙවන බවත් දන්වා ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු/ ඉංජිනේරු) විසින් දන්වා සිටින ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු/ ඉංජිනේරු) |
| 06. | ශ්‍රවනාගාරය ආයතනවලට රැස්වීම් සඳහා ලබා දීම. | බස්නාහිර පළාත් සභා ශ්‍රවනාගාරයේ මේවන විට වායුසමීකරණවල අලුත්වැඩියා කටයුතු සිදු වන බැවින් උත්සව හා රැස්වීම් ආයතනවලට ශ්‍රවනාගාරය ලබාදීමේදී 150 ක පමණ පිරිසකට සීමා කරන ලෙස හා පැය 04 ක පමණ කාලයක් පමණක් පැවැත්වෙන උත්සව සඳහා පමණක් ශ්‍රවනාගාරය ලබාදීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් දන්වා සිටින ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු/ සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 07. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ලබා දෙන පත්වීම් හා පවත්වන විභාග සම්බන්ධව | කණිෂ්ඨ සේවකයන් උසස් කිරීම මඟින් කළමනාකරණ සේවා නිලධාරීන් ලෙස පත්වීම් ලබාදීමට පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට අනුව තෝරාගන්නා ලද නිලධාරීන්ගේ නාම ලේඛනය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැනුම් දෙන ලදී.<br>තවද, විවිධ තනතුරු සඳහා පවත්වන කාර්යක්ෂමතා කඩඉම් විභාග මේ වන විට ප්‍රමාදයකින් තොරව පැවැත්වෙන බව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් දන්වා සිටි අතර එය කාර්යක්ෂම කිරීම සඳහා සිදු කිරීමට යමක් පවතීනම් එය වහාම දැනුම් දීමට කටයුතු කිරීමට ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

| | | | |
|---|---|---|---|
| | | තවද,වක්‍රලේඛවල පවතින ගැටළු හේතුවෙන් පුස්තකාලයාධිපති සහ තාක්ෂණ නිලධාරීන් බඳවා ගැනීමේ ගැටලුවක් පවතින බව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. ඒ අනුව තාක්ෂණික සහයක තනතුරුවල සිටින සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් තාක්ෂණ නිලධාරී තනතුරට පත්කිරීම සම්බන්ධව කටයුතු කල හැකි ආකාරය පිළිබඳව දීර්ඝව සාකච්ඡා කරන ලදී.<br>තවද, අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් කලාප කාර්යාලවලින් විශ්‍රාම ලබා ගන්නා ගුරුවරුන් සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම කොමිෂන් සභාව වෙත ලබා දීමේ ප්‍රමාදයක් පවතින බවට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව 2022 ඔක්තෝම්බර් මස රැස්වීමක් පවත්වා ප්‍රමාද වී ඇති තොරතුරු ඇතුලත් ‍ගොනු 2022.12.31 දින වන විට ලබා දීමට කටයුතු කරන ලෙස දන්වා සිටි නමුත් එදිනට එය සිදු නොවීම නිසා නැවත වරක් 2023.03.31 දිනට ලබා දෙන ලෙස දන්වා සිටි නමුත් එයද සිදු නොවූ බව දන්වා සිටින ලදී.<br>ඒ අනුව ඔවුන්ට තව දිනයක් ලබා නොදී කලාප මට්ටමින් තොරතුරු ලබා දී නොමැති නිලධාරීන්ගේ නාම ලේඛණය ප්‍රධාන ලේකම් වෙත එවන ලෙස දන්වන ලදී. | |
| 08 | 2023 වර්ෂයට අදාළ බස්නාහිර පළාත් නඩත්තු ක්‍රියාකාරී සැලැස්ම | මුදල් කොමිෂන් සභාව මගින් 2023 වර්ෂයේදී නඩත්තු ක්‍රියාකාරී සැලැසුම් ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාරයේ එකඟතාව ලබා ගැනීම යෝග්‍ය බව දන්වා ඇති බැවින් 2023 වර්ෂයේදී ඉටු කල යුතු අත්‍යවශ්‍යම නඩත්තු කටයුතු ඇතුලත් ව්‍යාපෘති යෝජනා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත කඩිනමින් ඉදිරිපත් කිරීම.<br>තවද, ප්‍රධාන ලේකම්ගේ අනුමැතියෙන් තොරව 2023 වර්ෂයේ නඩත්තු කටයුතු ඇතුලත් යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳව අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් විසින් වගකීම දැරිය යුතු බව ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් /නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 09 | බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් සහා සංකීර්ණයේ ස්ථාපිත කිරීම සම්බන්ධව | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව දැනට අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය පිහිටි ස්ථානයේ ස්ථාපනය සිදු කල නොහැකි බව තීරණය කරන ලදී. | සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් |
| 10 | HRMS පද්ධතියට තොරතුරු ඇතුලත් කිරීමේ නීතිමය තත්ත්වය සම්බන්ධයෙන් පවතින ගැටළු | මේ සඳහා වෙනම රැස්වීමක් අද දින පැවැත්වීමට යෝජනා වූ බැවින් එහිදී සාකච්ඡා කිරීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

| | | | |
|---|---|---|---|
| 11 | සති අන්තයේ හා රාජකාරි නිවාඩු දිනවල වාහනවල යතුරු නිකුත් කිරීම සඳහා උපදෙස් ලබා දෙන ලෙස වෙස්ත්‍රෝ ආරක්ෂක අංශයේ අධ්‍යක්ෂ විසින් යොමු කරන ලද ලිපි සම්බන්ධව | මේ සම්බන්ධව මීට පෙරද උපදෙස් ලබා දී ඇති අතර, සියලුම කරුණු සඳහා ඇතුලත් නව උපදෙස් ලිපියක් රියදුරන් වෙත හා ආරක්ෂක අංශය වෙත යොමු කරන ලෙස උපදෙස් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් /නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 12 | ඊ- ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධව | රජයේ ප්‍රසම්පාදන කටයුතු විද්‍යුත් ක්‍රමවේදයක් ඔස්සේ සිදු කිරීම සම්බන්ධව කටයුතු සිදු වෙමින් පවතින අතර ඒ සම්බන්ධව රාජ්‍ය මුදල් චක්‍රලේඛ 08/2019 හා 08/2019 (1) මේ වන විට නිකුත් කර ඇති අතර ඒ සම්බන්ධව අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති ආයතන දැනුවත් කරන ලෙස දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් |

එච්.ජී.ජී.ජේ.ධර්මසේන,
ප්‍රධාන ලේකම් (වැ.බ.),
බස්නාහිර පළාත.